සියලු ම හිමිකම් ඇවිරිණි.

# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

## AA3 විභාගය - 2018 ජනවාරි

## (AA31) මූල්‍ය ගිණුම්කරණය හා වාර්තාකරණය

(Financial Accounting and Reporting)

2018-01-20
පෙරවරු
[8.45 – 12.00]

පිටු ගණන : 10
ප්‍රශ්න ගණන: 09

- **අයදුම්කරුවන්ට උපදෙස්** (අවධානයෙන් කියවිය යුතුය):
  - (1) ***දී ඇති කාලය :*** *කියවීම සඳහා - විනාඩි 15 යි.*
    *උත්තර ලිවීම සඳහා - පැය 03 යි.*
  - (2) ***සියලුම ප්‍රශ්නවලට උත්තර සැපයිය යුතු වේ.***
  - (3) *ඉල්ලුම් කරන ලද **මාධ්‍යයෙන්, එක් භාෂාවකින් පමණක්,** ඔබ වෙත සපයන ලද **පොත්වල උත්තර** ලියන්න.*
  - (4) *ගණනය කිරීම් සහ පෙරවැඩ අමුණන්න. උපකල්පන කිසිවක් ඇතොත්, ඒවා පැහැදිලිව දක්වන්න.*
  - (5) *වැඩසටහන් ගතකිරීම කළ නොහැකි ගණක යන්ත්‍ර **පමණක්** භාවිත කිරීමට ඉඩ දෙනු ලැබේ.*
  - (6) *අර්ථකථන සහිත **කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව** අමුණා ඇත. සෑම ප්‍රශ්නයක්ම කළ යුතු ක්‍රියාවකින් යුක්ත වේ. කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුවේ එම ක්‍රියාව සඳහා දී ඇති අර්ථකථනය පදනම් කරගෙන අයදුම්කරුවන් විසින් ප්‍රශ්නය සඳහා අවශ්‍ය උත්තර සැපයිය යුතුය.*
  - (7) *ලකුණු 100 යි.*

---

## A කොටස

අනිවාර්යය ප්‍රශ්න හතර (04) කි.

(මුළු ලකුණු 20)

### 01 වන ප්‍රශ්නය

ප්‍රයෝජනවත් මූල්‍ය තොරතුරුවල මූලික ගුණාත්මක ලක්ෂණ වන්නේ, අදාල බව සහ විශ්වසනීය නියෝජනයයි.

මූල්‍ය තොරතුරුවල "අදාල බව" (Relevance) සහ "විශ්වසනීය නියෝජනය" (Faithful Representation) යන්න **පැහැදිලි කරන්න.** (ලකුණු 05)

### 02 වන ප්‍රශ්නය

**සීමාසහිත ABC සමාගමේ** 2017 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙන් පහත සඳහන් ශේෂයන් උපුටා ගන්නා ලදී:

| | **2017 මාර්තු 31 දිනට (රු.)** |
|---|---|
| වත්කම්: | |
| පිරියත සහ යන්ත්‍ර, පිරිවැයට | 5,000,000 |
| පිරියත සහ යන්ත්‍ර මත සමුච්චිත ක්ෂය | (2,500,000) |
| **පිරියත සහ යන්ත්‍රවල ධාරණ අගය** | **2,500,000** |

2017 මාර්තු 31 දිනට, පිරියත සහ යන්ත්‍ර මත බදු සඳහා වූ සමුච්චිත ක්ෂය රු.3,000,000/- කි. 2016 අප්‍රේල් 01 දිනට විලම්බිත බදු වත්කම් / වගකීම් ගිණුමේ ශේෂයක් නොවීය.

**ඔබ විසින් කළ යුතු දැ:**

(a) **සීමාසහිත ABC සමාගමේ** 2017 මාර්තු 31 දිනට තාවකාලික වෙනස්කම් (temporary differences) **හඳුනා දක්වන්න.** (ලකුණු 02)

(b) **සීමාසහිත ABC සමාගමේ** 2017 මාර්තු 31 දිනට විලම්බිත බදු වගකීම **ගණනය කරන්න.** (ලකුණු 03)

*(**සීමාසහිත ABC සමාගමට** අදාල වන ආදායම් බදු අනුපාතය 28% ක් ලෙස උපකල්පනය කරන්න)* (මුළු ලකුණු 05)

## 03 වන ප්‍රශ්නය

සංකලිත වාර්තාකරණය (Integrated Reporting), ආයතන තම ක්‍රියාකාරකම් පිළිබඳ සිතන, සැලසුම්කරන සහ වාර්තාකරන ආකාරය කෙරෙහි බලපෑම් කරයි. සංකලිත වාර්තාවක මූලික වශයෙන් එකිනෙකට සම්බන්ධ වන්නා වූ සංරචක අටක් (08) අන්තර්ගත වන නමුත් ඒවා අන්‍යෝන්‍ය වශයෙන් බහිෂ්කාර නොවේ.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) සංකලිත වාර්තාකරණයේ අරමුණක් **සඳහන් කරන්න.** (ලකුණු 02)

(b) සංකලිත වාර්තාවක (Integrated Report) ප්‍රධාන සංරචක (components) තුනක්(03) **සඳහන් කරන්න.** (ලකුණු 03)

(මුළු ලකුණු 05)

## 04 වන ප්‍රශ්නය

**සීමාසහිත ලයිසන් ඔටෝ (පෞද්ගලික) සමාගමේ** 2017 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයෙන් සහ 2017 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙන් පහත සඳහන් ශේෂයන් උපුටා ගන්නා ලදී:

| දිනෙන් අවසන් වර්ෂය සඳහා | **2017 මාර්තු 31 (රු.'000)** |
|---|---|
| යන්ත්‍ර ඉවත් කිරීම මත ලාභය | 500 |
| යන්ත්‍ර මත වර්ෂය සඳහා ක්ෂය | 1,250 |

| | **2017 මාර්තු 31 දිනට (රු.'000)** | **2016 මාර්තු 31 දිනට (රු.'000)** |
|---|---|---|
| යන්ත්‍රවල පිරිවැය | 3,000 | 2,500 |
| යන්ත්‍රවල සමුච්චිත ක්ෂය | (2,000) | (1,500) |

2017 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය තුළදී ඉවත් කරන ලද යන්ත්‍රයේ පිරිවැය රු.1,000,000/- කි. ප්‍රවර්තන වර්ෂය සඳහා වූ ක්ෂය වටිනාකම තුළ ඉවත්කරන ලද යන්ත්‍රයේ, ඉවත් කරන ලද දිනය තෙක් වූ ක්ෂය ද ඇතුළත් වේ. 2017 මාර්තු 31 දින නව යන්ත්‍රයක් මිලදී ගත් අතර, එම යන්ත්‍රය සම්බන්ධයෙන් 2017 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය තුළදී කිසිදු ක්ෂය වෙන්කිරීමක් සිදුකර නොමැත.

**ඔබ විසින් කළ යුතු දෑ:**

පැරණි යන්ත්‍රය ඉවත් කිරීමෙන් ලැබුන මුදල් සහ නව යන්ත්‍රය මිලදී ගැනීමේදී ගෙවූ මුදල් වෙන් වෙන් වශයෙන් දක්වමින්, 2017 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආයෝජන ක්‍රියාකාරකම්වලින් පැන නගින ශුද්ධ මුදල් ප්‍රවාහයන් **පිළියෙල කරන්න**. (ලකුණු 05)

*A කොටසෙහි අවසානය*

## <u>B කොටස</u>

අනිවාර්යය ප්‍රශ්න තුන (03) කි.

(මුළු ලකුණු 30)

## 05 වන ප්‍රශ්නය

(a) නිෂ්පාදන සමාගමක් වන **සීමාසහිත කෙමිකෙම් පොදු සමාගම** විසින් 2017 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය තුළදී නව නිෂ්පාදිතයක් සංවර්ධනය කරන ලදී. සමාගම, නව නිෂ්පාදිතයට අදාලව පර්යේෂණයක්ද (research) සිදුකරන ලද අතර, ඒ වෙනුවෙන් රු. මිලියන 3 ක වියදමක් වර්ෂය තුලදී දරණ ලදී. සමාගම විසින් අදාල නිෂ්පාදිතය සඳහා පේටන්ට් බලපත්‍රය 2017 මාර්තු මාසයේදී ලියාපදිංචි කිරීමෙන් අනතුරුව 2017 අප්‍රේල් මාසයේදී වාණිජමය අරමුණින් යුතුව එය නිෂ්පාදනය කිරීම ආරම්භ කරන ලදී. 2016/17 වර්ෂය තුලදී නව නිෂ්පාදිතය සඳහා දරණ ලද අනෙකුත් වියදම් පහත පරිදි වේ:

| | රු. |
|---|---|
| නව නිෂ්පාදිතය ලියාපදිංචි කිරීමේ ගාස්තුව (පේටන්ට් බලපත්‍රය) | 25,000 |
| කාර්ය මණ්ඩලය පුහුණු කිරීමේ පිරිවැය | 300,000 |
| විකුණුම් ප්‍රවර්ධන පිරිවැය | 50,000 |
| නව නිෂ්පාදිතය ජනනය කිරීමට දැරූ වෘත්තිමය ගාස්තු | 250,000 |

**ඔබ විසින් කළ යුතු දෑ:**

**සීමාසහිත කෙමිකෙම් පොදු සමාගම** විසින් 2017 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වියදම් ලෙස හඳුනාගත යුතු වටිනාකම සහ සමාගමේ මූල්‍ය ප්‍රකාශනවල අස්පෘශ්‍ය වත්කමක් (intangible asset) ලෙස ප්‍රාග්ධනිත කළයුතු වටිනාකම **තක්සේරු කරන්න**. (ලකුණු 06)

(b) **ABC සමාගම** විසින් නිෂ්පාදන පිරියතක් ඉදිකිරීම වෙනුවෙන් 2016 අප්‍රේල් 01 දින 15% ක වාර්ෂික පොලී අනුපාතිකයකට රු. මිලියන 20 ක බැංකු ණයක් ලබා ගන්නා ලදී. අදාල නිෂ්පාදන පිරියත ඉදිකිරීම 2016 මැයි 01 දින ආරම්භ කළ අතර, එහි ඉදිකිරීම් 2017 මාර්තු 31 දින අවසන් කරන ලදී.

ණය මුදලින් භාවිතයට නොගත් ප්‍රමාණය තාවකාලිකව ආයෝජනය කළ අතර, එමගින් 2017 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය තුලදී රු.300,000/- ක පොලී ආදායමක් උපයන ලදී.

**ඔබ විසින් කළ යුතු දෑ:**

2017 මාර්තු 31 දිනට නව නිෂ්පාදන පිරියත මත ප්‍රාග්ධනිත කළ හැකි ණය ගැනුම් පිරිවැය (borrowing cost) **ගණනය කරන්න**. (ලකුණු 04)

(මුළු ලකුණු 10)

## **06** වන ප්‍රශ්නය

**සීමාසහිත දියසෙත් නිෂ්පාදන පොදු සමාගමේ** 2017 මාර්තු 31 දිනෙන් සහ 2016 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂ සඳහා විස්තීර්ණ ආදායම් ප්‍රකාශනවල සහ 2017 මාර්තු 31 දිනට සහ 2016 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනවල උද්ධෘතයන් පහත දැක්වේ:

**විස්තීර්ණ ආදායම් ප්‍රකාශනවල උද්ධෘතයන්** *(රු.'000)*

| දිනෙන් අවසන් වර්ෂය සඳහා | **2017 මාර්තු 31** | **2016 මාර්තු 31** |
|---|---|---|
| විකුණුම් | 28,750 | 27,050 |
| විකුණුම් පිරිවැය | 20,400 | 18,750 |
| දළ ලාභය | 8,350 | 8,300 |
| පොලී වියදම | 540 | 220 |
| ආදායම් බදු | 1,240 | 1,070 |
| වර්ෂය සඳහා ලාභය | 5,220 | 6,085 |

**මූල්‍ය තත්ත්ව ප්‍රකාශනවල උද්ධෘතයන්** *(රු.'000)*

| දිනට | **2017 මාර්තු 31** | **2016 මාර්තු 31** |
|---|---|---|
| ජංගම වත්කම් | 10,470 | 8,260 |
| ජංගම වගකීම් | 3,200 | 3,875 |
| වෙළෙඳ ලැබිය යුතු මුදල් | 3,460 | 2,220 |
| තොගය | 5,240 | 4,920 |
| කොටස්හිමියන්ගේ ස්කන්ධය | 22,030 | 15,410 |
| ණයකර | 3,500 | 2,000 |

**සීමාසහිත දියසෙත් නිෂ්පාදන පොදු සමාගමේ** මුළු විකුණුම් වලින් 70% ක් ණය පදනම මත සිදුකරන බව උපකල්පනය කරන්න.

පහත සඳහන් ගණනය කළ අනුපාත **සීමාසහිත දියසෙත් නිෂ්පාදන පොදු සමාගමේ** තරඟකාරී සමාගමක් වන **සීමාසහිත මිගාර නිෂ්පාදන පොදු සමාගමේ** පොත්වලින් 2017 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා / අවසන් දිනට උපුටාගෙන ඇත:

| | |
|---|---|
| දළ ලාභ අනුපාතය | 30% |
| ශුද්ධ ලාභ අනුපාතය | 25% |
| යෙදවූ ප්‍රාග්ධනය මත ප්‍රතිලාභ අනුපාතය (ROCE) | 32.4% |
| ක්ෂණික වත්කම් අනුපාතය | වාර 2.08 |
| ණය එකතුකිරීමේ කාල සීමාව | දින 60 |

**ඔබ විසින් කළ යුතු දෑ:**

2017 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා / අවසන් දිනට **සීමාසහිත දියසෙත් නිෂ්පාදන පොදු සමාගමේ** සහ **සීමාසහිත මිගාර නිෂ්පාදන පොදු සමාගමේ** කාර්යසාධනය **විශ්ලේෂණය කරන්න**.

*(ඉඟිය: ඔබ හට ඉහත අනුපාතයන්, **සීමාසහිත දියසෙත් නිෂ්පාදන පොදු සමාගම** සඳහාද ගණනය කරගත හැකිය.)*

(ලකුණු 10)

## 07 වන ප්‍රශ්නය

**සීමාසහිත ABC සමාගමේ** 2017 මාර්තු 31 දිනට සහ 2016 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයන් පහතින් දී ඇත:

**සීමාසහිත ABC සමාගම**
**මූල්‍ය තත්ත්ව ප්‍රකාශන** *(රු.'000)*

| | 2017 මාර්තු 31 දිනට | | 2016 මාර්තු 31 දිනට | |
|---|---|---|---|---|
| **වත්කම්** | | | | |
| **ජංගම නොවන වත්කම්:** | | | | |
| දේපළ, පිරියත සහ උපකරණ (පිරිවැයට) | 10,000 | | 10,000 | |
| සමුච්චිත ක්ෂය | (4,500) | | (4,000) | |
| ධාරණ අගය | | 5,500 | | 6,000 |
| **ජංගම වත්කම්:** | | | | |
| තොග | 5,500 | | 6,000 | |
| වෙළෙඳ සහ වෙනත් ලැබිය යුතු මුදල් | 8,100 | | 5,160 | |
| මුදල් සහ මුදල්වලට සමාන දෑ | 250 | 13,850 | 300 | 11,460 |
| **මුළු වත්කම්** | | **19,350** | | **17,460** |
| **ස්කන්ධය සහ වගකීම්** | | | | |
| **ස්කන්ධය:** | | | | |
| සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනය | | 10,000 | | 10,000 |
| නිදහස් කළ නොහැකි වරණීය කොටස් ප්‍රාග්ධනය | | 4,000 | | 2,500 |
| රඳවාගත් ඉපැයීම් | | 2,300 | | 400 |
| **මුළු ස්කන්ධය** | | 16,300 | | 12,900 |
| **ජංගම නොවන වගකීම්:** | | | | |
| බැංකු ණය | | 350 | | 1,250 |
| **ජංගම වගකීම්:** | | | | |
| බැංකු ණය | 750 | | 750 | |
| වෙළෙඳ සහ වෙනත් ගෙවිය යුතු මුදල් | 1,660 | | 2,300 | |
| ගෙවිය යුතු ණය පොලී | 40 | | 60 | |
| ගෙවිය යුතු ආදායම් බදු | 250 | 2,700 | 200 | 3,310 |
| **මුළු ස්කන්ධය සහ වගකීම්** | | **19,350** | | **17,460** |

පහත සඳහන් අතිරේක තොරතුරු ද සපයා ඇත:

(1) 2017 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් බදු වියදම රු.600,000/- කි.

(2) 2017 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා බැංකු ණය මත පොලී වියදම රු.380,000/- කි.

(3) වර්ෂය තුළදී කිසිදු දේපළ, පිරියත සහ උපකරණ ඉවත් කිරීමක් හෝ මිලදී ගැනීමක් සිදුකර නොමැත.

(4) වර්ෂය තුළදී ලාභාංශ ගෙවා හෝ ප්‍රකාශ කර නොමැත.

**ඔබ විසින් කළ යුතු දෑ:**

2017 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා **සීමාසහිත ABC සමාගමේ** මුදල් ප්‍රවාහ ප්‍රකාශනය වක්‍ර ක්‍රමය (indirect method) භාවිත කර **පිළියෙල කරන්න**. (ලකුණු 10)

*B කොටසෙහි අවසානය*

# C කොටස

අනිවාර්ය ප්‍රශ්න දෙක (02) කි.

(මුළු ලකුණු 50)

## 08 වන ප්‍රශ්නය

**සීමාසහිත ගජබා පොදු සමාගමේ** 2017 මාර්තු 31 දිනට ශේෂ පිරික්සුම පහත දැක්වේ:

**සීමාසහිත ගජබා පොදු සමාගම**

**2017 මාර්තු 31 දිනට ශේෂ පිරික්සුම** *(රු.'000)*

| | හර | බැර |
|---|---|---|
| සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනය - සාමාන්‍ය කොටස් 2,000,000 | | 20,000 |
| නිදහස් කළ හැකි වරණීය කොටස් ප්‍රාග්ධනය (කොටස් 1,000,000) | | 5,000 |
| 2016 අප්‍රේල් 01 දිනට රඳවාගත් ඉපැයීම් | | 6,500 |
| දේපළ, පිරියත සහ උපකරණ - (පිරිවැයට): | | |
| ඉඩම සහ ගොඩනැගිල්ල (ඉඩමේ වටිනාකම - රු.20,000,000/-) | 25,000 | |
| මෝටර් වාහන | 15,000 | |
| කාර්යාල උපකරණ | 4,000 | |
| 2016 අප්‍රේල් 01 දිනට සමුච්චිත ක්ෂය: | | |
| ගොඩනැගිල්ල | | 2,000 |
| මෝටර් වාහන | | 6,000 |
| කාර්යාල උපකරණ | | 2,600 |
| 2017 මාර්තු 31 දිනට තොගය (පිරිවැයට) | 9,500 | |
| වෙළෙඳ ලැබිය යුතු මුදල් / වෙළෙඳ ගෙවිය යුතු මුදල් | 11,000 | 6,000 |
| 2015/16 තක්සේරු වර්ෂය සඳහා ගෙවිය යුතු ආදායම් බදු | | 400 |
| බැංකු ණය | | 3,000 |
| බැංකුවේ ඇති මුදල් | 3,000 | |
| අතැ'ති මුදල් | 200 | |
| 2016 අප්‍රේල් 01 දිනට වෙළෙඳ ලැබිය යුතු මුදල් සඳහා ප්‍රතිපාදනය | | 1,500 |
| විකුණුම් පිරිවැය / විකුණුම් | 107,000 | 160,000 |
| ගෙවූ අතුරු ලාභාංශ - සාමාන්‍ය කොටස් | 2,000 | |
| නිදහස් කළ හැකි වරණීය කොටස් මත ගෙවූ ලාභාංශ | 500 | |
| පරිපාලන වියදම් | 11,460 | |
| බෙදාහැරීමේ වියදම් | 16,740 | |
| මූල්‍ය වියදම් | 5,600 | |
| ගෙවූ ආදායම් බදු | 2,000 | |
| | **213,000** | **213,000** |

පහත සඳහන් අතිරේක තොරතුරු ද සපයා ඇත:

(1) වර්ෂය තුළදී සමාගම විසින් පහත සඳහන් වත්කම ඉවත් කරන ලදි:

| මිලට ගත් දිනය | වත්කම | පිරිවැය (රු.) | ඉවත් කළ දිනය | විකිණීමෙන් ලද මුදල (රු.) |
|---|---|---|---|---|
| 01.10.2013 | බෙදාහැරීමේ වෑන් රථය | 2,300,000 | 31.12.2016 | 1,200,000 |

විකිණීමෙන් ලද මුදල, බැංකු ගිණුමට හර කර විකුණුම් ගිණුමට බැර කර ඇත. ඒ හැර වෑන් රථය ඉවත් කිරීම සම්බන්ධයෙන් වෙනත් කිසිදු සටහනක් තබා නොමැත.

(2) 2017 මාර්තු 31 දින සමාගම විසින් එහි ගොඩනැගිල්ල ප්‍රත්‍යාගණනය කරන ලද අතර, ප්‍රත්‍යාගණනය හේතුවෙන් ගොඩනැගිල්ලේ වටිනාකම රු. මිලියන 2 කින් ඉහළ ගියේය. මේ සම්බන්ධයෙන් පොත්වල කිසිඳු සටහනක් තබා නොමැත.

(3) 2017 මාර්තු 31 දිනට තොගයේ ශුද්ධ උපලබ්ධි අගය රු.9,375,000/- කි.

(4) දේපළ, පිරියත සහ උපකරණ, පිරිවැය හෝ ප්‍රත්‍යාගණන අගය මත සරල මාර්ග ක්‍රමයට ක්ෂය ගණනය කරනු ලබයි. දේපළ, පිරියත සහ උපකරණවල ප්‍රයෝජනවත් ආයුකාල පහත පරිදි වේ:

| | | |
|---|---|---|
| ගොඩනැගිල්ල | : | අවුරුදු 25 |
| මෝටර් වාහන | : | අවුරුදු 04 |
| කාර්යාල උපකරණ | : | අවුරුදු 08 |

(5) වෙළෙඳ ලැබිය යුතු මුදල් සම්බන්ධයෙන් පහත සඳහන් ගැලපිලි සිදුකළ යුතුය:

- රු.100,000/- ක වෙළෙඳ ලැබිය යුතු මුදල් ශේෂයක් වර්ෂය තුළදී බොල්ණය බවට පත්විය. කෙසේවෙතත්, අදාල වෙළෙඳ ලැබිය යුතු මුදල සඳහා අඩමාන ණය ලෙස පසුගිය වර්ෂයේ පොත්වල අඩමාන ණය සඳහා වූ ප්‍රතිපාදනයක් සිදුකර තිබුණි.
- 2017 මාර්තු 31 දිනට ඉතිරි වෙළෙඳ ලැබිය යුතු මුදල්වලින් 5% ක පොදු ප්‍රතිපාදනයක් කළ යුතුය.

(6) පහත සඳහන් වියදම් 2017 මාර්තු 31 දිනට පොත්වල උපචිත කළ යුතු වේ:

| | රු. |
|---|---|
| දුරකතන සහ විදුලි වියදම් | 60,000 |
| ප්‍රචාරණය | 200,000 |

(7) 2017 මාර්තු 31 දිනට හිඟව ඇති බැංකු ණය ශේෂයෙන් ½ ක ප්‍රමාණයක් ඊළඟ වර්ෂය තුළදී ගෙවිය යුතුය.

(8) 2016/17 තක්සේරු වර්ෂය සඳහා වන ආදායම් බදු වගකීම රු.3,500,000/- ක් ලෙස ඇස්තමේන්තු කර ඇත.

(9) 2017 මැයි 31 දින පවත්වන ලද අධ්‍යක්ෂ මණ්ඩල රුස්වීමේදී, 2017 මාර්තු 31 දිනට පැවති සාමාන්‍ය කොටස් සඳහා කොටසකට රු.1/- බැගින් වූ අවසාන ලාභාංශයක් ගෙවීමට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කරන ලදී:

(10) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2017 ජුනි 15 දින මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා අනුමැතිය ලබාදෙන ලදී.

**ඔබ විසින් කළ යුතු දෑ:**

ප්‍රසිද්ධ කිරීමට සුදුසු ආකාරයෙන්, **සීමාසහිත ගජබා පොදු සමාගමේ** පහත සඳහන් දෑ, **පිළියෙල කරන්න**:

(a) 2017 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභය හෝ අලාභය සහ වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය (විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය). (ලකුණු 10)

(b) 2017 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය. (ලකුණු 07)

(c) 2017 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ස්කන්ධයේ වෙනස්වීම් දැක්වෙන ප්‍රකාශනය. (ලකුණු 03)

(d) 2017 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා දේපළ, පිරියත සහ උපකරණවල වෙනස්වීම් දැක්වෙන ප්‍රකාශනය. (ලකුණු 05)

(මුළු ලකුණු 25)

## 09 වන ප්‍රශ්නය

(A) (a) 2016 අප්‍රේල් 01 දින **සීමාසහිත බීමා සමාගමේ** කොටස් ප්‍රාග්ධනයෙන් 70% ක් රු. මිලියන 12 ක ආයෝජනයකට **සීමාසහිත ගැමුණු පොදු සමාගම** විසින් අත්පත් කරගන්නා ලදී. එදිනට **සීමාසහිත බීමා සමාගමේ** හඳුනාගත හැකි වත්කම්වල සාධාරණ අගය ඒවායේ පොත් අගයට සමාන විය. එදිනට, පාලනය නොවන හිමිකමේ (non-controlling interest) සාධාරණ අගය රු. මිලියන 3 ක් විය.

අත්පත් කරගත් දිනට **සීමාසහිත බීමා සමාගමේ** පොත්වල පහත සඳහන් ශේෂයන් පෙන්විය:

| | **රු. ('000)** |
|---|---|
| ප්‍රකාශිත ප්‍රාග්ධනය - සාමාන්‍ය කොටස් | 7,000 |
| පොදු සංචිත | 1,800 |
| රඳවාගත් ඉපැයීම් | 2,000 |

**ඔබ විසින් කළ යුතු දෑ:**

ඒකාබද්ධ කිරීමේදී ඇතිවන කීර්තිනාමය **ගණනය කරන්න**. (ලකුණු 05)

(b) 2017 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා **සීමාසහිත ගැමුණු පොදු සමාගමේ** සහ **සීමාසහිත බීමා සමාගමේ** විස්තීර්ණ ආදායම් ප්‍රකාශන පහත දැක්වේ:

**2017 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**
**විස්තීර්ණ ආදායම් ප්‍රකාශන** *(රු.'000)*

| | **සීමාසහිත ගැමුණු පොදු සමාගම** | **සීමාසහිත බීමා සමාගම** |
|---|---|---|
| විකුණුම් | 250,000 | 110,000 |
| විකුණුම් පිරිවැය | (140,000) | (72,000) |
| **දළ ලාභය** | **110,000** | **38,000** |
| **වෙනත් ආදායම්:** | | |
| පොලී ආදායම | 800 | 250 |
| ලාභාංශ ආදායම | 1,600 | 45 |
| වෙනත් ආදායම් | 1,550 | - |
| | **113,950** | **38,295** |
| **වියදම්:** | | |
| බෙදාහැරීමේ වියදම් | (40,000) | (13,500) |
| පරිපාලන වියදම් | (10,000) | (3,000) |
| මූල්‍ය වියදම් | ( 8,000) | (2,000) |
| **බදු පෙර ලාභය** | **55,950** | **19,795** |
| ආදායම් බදු | (14,500) | (2,000) |
| **වර්ෂය සඳහා ලාභය** | **41,450** | **17,795** |
| වෙනත් විස්තීර්ණ ආදායම් | - | - |
| **වර්ෂය සඳහා මුළු විස්තීර්ණ ආදායම** | **41,450** | **17,795** |

පහත සඳහන් අතිරේක තොරතුරු ද සපයා ඇත:

(1) වර්ෂය තුළදී **සීමාසහිත ගැමුණු පොදු සමාගම** විසින් පිරිවැයට 25% ක ලාභාන්තිකයක් සහිතව භාණ්ඩ තොග **සීමාසහිත බීමා සමාගමට** රු.2,000,000/- කට විකුණන ලදී. **සීමාසහිත බීමා සමාගමේ** 2017 මාර්තු 31 දිනට පැවති අවසන් තොගය තුළ **සීමාසහිත ගැමුණු පොදු සමාගමෙන්** මිලට ගත් රු.500,000/- ක් වටිනා භාණ්ඩ ඇතුලත් වේ.

(2) **සීමාසහිත ගැමුණු පොදු සමාගමේ** කර්මාන්තශාලා පරිශ්‍රයේ පිහිටි **සීමාසහිත බීමා සමාගමේ** ගබඩා සඳහා වූ කුලිය ලෙස රු.50,000/- ක මාසික කුලියක් 2016 අප්‍රේල් 01 දින සිට **සීමාසහිත බීමා සමාගම** විසින් **සීමාසහිත ගැමුණු සමාගම** වෙත ගෙවන ලදී.

(3) **සීමාසහිත බීමා සමාගම** විසින් වර්ෂයකට 12% ක පොලී අනුපාතයකට යටත්ව රු.5,000,000/- ක ණයක් **සීමාසහිත ගැමුණු පොදු සමාගමෙන්** 2016 මාර්තු 31 දින ලබාගන්නා ලදී. 2016/17 වර්ෂයට අදාල පොලිය **සීමාසහිත ගැමුණු පොදු සමාගමට** සම්පූර්ණයෙන් ගෙවා ඇත. වර්ෂය තුළදී ප්‍රාග්ධන ආපසු ගෙවීමක් සිදුකර නොමැත.

(4) **සීමාසහිත ගැමුණු පොදු සමාගමේ** ලාභාංශ ආදායම තුළ **සීමාසහිත බීමා සමාගමෙන්** ලද රු.500,000/- ක අතුරු ලාභාංශයක් ඇතුලත් අතර, **සීමාසහිත බීමා සමාගම** විසින් මෙම ලාභාංශය ගෙවා ඇත්තේ වර්ෂයේ ලාභය භාවිත කරගෙනය.

(5) 2017 ජනවාරි 01 දින රු.1,000,000/- ක් පිරිවැය වූ ඉඩමක් **සීමාසහිත ගැමුණු පොදු සමාගම** විසින් **සීමාසහිත බීමා සමාගම** වෙත රු.1,400,000/- කට විකුණන ලදී.

**ඔබ විසින් කළ යුතු දෑ:**

2017 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ඒකාබද්ධ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය **පිළියෙල කරන්න**.

(ලකුණු 14)

(B) 2017 මාර්තු 31 දිනෙන් සහ 2016 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂ සඳහා පහත සඳහන් ගණනය කළ අනුපාතයන් **සීමාසහිත XYZ සමාගමෙන්** උපුටා ගන්නා ලදී:

| **මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා** | **2017** | **2016** |
|---|---|---|
| ජංගම අනුපාතය | 1.2 | 1.5 |
| ණය එකතුකිරීමේ කාලසීමාව | දින 75 | දින 45 |
| තොග රඳවා ගැනීමේ කාල සීමාව | දින 35 | දින 25 |

**ඔබ විසින් කළ යුතු දෑ:**

පෙර වර්ෂය සමඟ සසඳා බැලීමේදී ඉහත දැක්වෙන එක් එක් අනුපාතය, 2017 දී වෙනස්වීමට තුඩුදෙන ලදැයි සිතිය හැකි හේතු දෙක(02) බැගින් **සඳහන් කරන්න**. (ලකුණු 06)

(මුළු ලකුණු 25)

*C කොටසෙහි අවසානය*

# කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව

| දැනුම් ක්‍රියාවලිය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචන |
|---|---|---|
| 01 මට්ටම<br>**අවබෝධය**<br><br>වැදගත් තොරතුරු ආවර්ජනය සහ පැහැදිලි කිරීම. | **නිර්වචනය කරන්න** | ස්වභාවය, විෂය පථය හෝ තේරුම නිශ්චිතව ප්‍රකාශ කිරීම. |
| | **අඳින්න** | හැඩයක් හෝ රූපසටහනක් ගෙන හැර දැක්වීම. |
| | **හඳුනා දක්වන්න** | යමක් මනා සැලකිලිමත් වීමකින් අනතුරුව හඳුනා ගැනීම හෝ තහවුරු කිරීම හෝ තෝරා ගැනීම. |
| | **ලැයිස්තුගත කරන්න** | විස්තර කිරීමකින් තොරව අදාල කරුණු එකින් එක වචනයෙන් ලියා දැක්වීම. |
| | **සම්බන්ධ කරන්න** | තාර්කික හෝ හේතු කාරක සම්බන්ධතාවය පෙන්නුම් කිරීම හෝ තහවුරු කිරීම. |
| | **සඳහන් කරන්න** | යමක් ස්ථිර ලෙස පැහැදිලිව ප්‍රකාශ කිරීම. |
| | **ගණනය කරන්න** | ගණිතමය ගණනය කිරීම. |
| | **විමසන්න** | අවසන් නිගමනයකට පිවිසීම සඳහා විවිධ පැතිකඩ තර්කානුකූලව සවිස්තරව පරීක්ෂා කිරීම. |
| | **පැහැදිලි කරන්න** | අදාල කරුණු සවිස්තරාත්මකව දැක්වීම. |
| | **අර්ථකතනය කරන්න** | අවබෝධයට පහසු සුපුරුදු පද මගින් අර්ථය ඉදිරිපත් කිරීම. |
| | **හඳුනාගන්න** | සෙවීමෙන් හෝ ප්‍රයත්න දැරීමෙන් නිගමනයකට එළඹීම. |
| | **සටහන් කරන්න** | අදාල කරුණු විස්තරාත්මකව සටහන් කිරීම. |
| | **සාරාංශගත කරන්න** | කරුණු වශයෙන් හෝ සංඛ්‍යා වශයෙන් ප්‍රධාන කරුණු කෙටියෙන් දැක්වීම. |

| දැනුම් ක්‍රියාවලිය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචන |
|---|---|---|
| 02 මට්ටම<br>**භාවිතය**<br><br>ඉගෙනගත් පසුබිම නොවන පසුබිමක දැනුම භාවිත කිරීම / සංවෘත ගැටළු විසදීම. | **භාවිත කරන්න** | ප්‍රයෝගිකව භාවිතයේ යොදන්න. |
| | **තක්සේරු කරන්න** | වටිනාකම, ස්වභාවය, හැකියාව හෝ ගුණාත්මක බව තීරණය කරන්න. |
| | **ප්‍රදර්ශනය කරන්න** | සුවිශේෂී ලෙස උදාහරණ සමග ඔප්පු කරන්න. |
| | **ප්‍රස්තාර දක්වන්න** | ප්‍රස්තාර මගින් නියෝජනය කරන්න. |
| | **පිළියෙල කරන්න** | දී ඇති විස්තර සැලැස්මකට ගොනු කිරීම. |
| | **ප්‍රමුඛතා දක්වන්න** | වැදගත්කම, අනුපිළිවෙල අනුව දක්වන්න. |
| | **සසඳන්න** | තවත් දෙයක් සමග සංගත වේදැයි බැලීම. |
| | **විසඳන්න** | ගණනය කිරීම හා / හෝ පැහැදිලි කිරීම් හරහා විසඳුම් සෙවීම. |

| දැනුම් ක්‍රියාවලිය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචන |
|---|---|---|
| 03 මට්ටම<br>**විශ්ලේෂණය**<br><br>අදහස් අතර සම්බන්ධතා ගොඩනගා සමාන අසමානතා බැලීම / විවෘත ගැටළු විසදීම. | **විශ්ලේෂණය කරන්න** | විසඳුම් හෝ ප්‍රතිඵලය තීරණය කිරීම පිණිස විස්තරාත්මකව පරීක්ෂා කරන්න. |
| | **සමානකම් බලන්න** | සමානකම් සොයා ගැනීම පිණිස පරීක්ෂා කිරීම. |
| | **අසමානතා බලන්න** | අසමානතා හෝ වෙනස්කම් සෙවීම පිණිස පරීක්ෂා කිරීම. |
| | **වෙනස්කොට දක්වන්න** | යමක් තවෙකෙකින් වෙනස්කොට දක්වන දෑ හඳුනා ගැනීම. |
| | **සැකිල්ලක් සේ දක්වන්න** | සුවිශේෂී ලක්ෂණ සාරාංශ කොට දැක්වීම. |